සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்தியமாகாணகல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

12 ශ්‍රේණිය

අ.පො.ස (උ.පෙළ )ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන
ඒකක පරීක්ෂණ - 2020

51 | S | I

චිත්‍ර කලාව

ඒකක අංකය - 03

පැය එකයි

❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

(6.5 -යුරෝපීය උපස්ථිතිවාදි හා පශ්චාත් උපස්ථිතිවාදීන් කලාකරුවන්ගේ නිර්මාණ අධ්‍යයනය කරයි)

1. උපස්ථිතිවාදි ශිල්පීන් දෙදෙනෙකු නම් කරන්න…......................................................

2. පශ්චාත් උපස්ථිතිවාදි ශිල්පීන් දෙදෙනෙකු නම් කරන්න…............................................

3. හිරු උදාවනම් කෘතිය කාගේ නිර්මාණයක්ද? ...............................................................

4. උපස්ථිතිවාදි සිතුවම්වල දක්නට ලැබෙන ප්‍රධානම ලක්ෂණය කුමක්ද?................................

5. උපස්ථිතිවාදය කුමන නගරයක් මුල්කරගෙන කිනම් සියවසක ආරම්භ වුයේද?

.....................................................................................................

6. වේගවත් පින්සල් පහරින් ස්වභාවික ආලෝකය වැටෙන ආකාරය පිළිබඳව සිතුවම් ඇඳි ශිල්පියා කවරෙක්ද? .....................................................................

7. පැස්ටල් හා තෙල් සායම් මාධ්‍ය භාවිතයෙන් වේගවත් චලනමය ඉරියව් භාවිතයෙන් චිත්‍ර නිර්මානය කළ උපස්ථිතිවාදි ශිල්පියා කව්ද?........................................................

8. පවතින සූර්යාලෝනයට අනුව සිතුවම් නිර්මාණය කිරිමේ න්‍යාය ප්‍රථමවරට ඉදිරිපත් කළ ශිල්පියා නම් කරන්න…......................................................

9. උපස්ථිතිවාදි කාන්තා නියෝජන කරන ශිල්පිනිය කව්ද?..........................................

10. ඇගේ නිර්මාණ සඳහා වස්තුව විෂය වු තේමාවන් දෙකක් සඳහන් කරන්න?

.........................................................................................................................

11. මානව ජිවිතය දෙස සානුකම්පිත දෘෂ්ඨියකින් බලා වින්සන්ට් වැංගෝ විසින් නිර්මාණය කරන ලද සිතුවමක් නම් කරන්න…..................................................................

12. දාර්ශනික මෙන්ම සංකේතාත්මක ව්‍යුක්තිකරණය අර්ථ දක්වන සිතුවම් නිර්මාණය කළ පශ්චාත් උපස්ථිතිවාදි ශිල්පියා කව්ද? ...............................................................

13. වර්ණමත වර්ණ තවරා කැන්වසය මත සිතුවම් කළ පශ්චාත් උපස්ථිතිවාදි ශිල්පියා නම් කරන්න…...................................................

.........................................................................................................................

14.1889 වින්සන්ට් වැංගෝ ශිල්පියා විසින් නිර්මාණය කරන ලද නිදිගත් නගරය නගරය සහිත සිතුවම කුමක්ද? ......................................................................

15. කාන්තා රූපවල ඉරියව් අනුව උපත, ජීවිතය, මරණය, සංකේතාත්මකව නිරූපණය කරන ගොගැන් විසින් නිර්මානය කරන ලද සිතුවම කුමක්ද? ..................................................

16. ප්‍රකෘති ලෝකයේ දෘශ්‍ය අරමුණු වියුක්තිකරණය කොට එක් වර්ණයක් සුවිශේෂී කර ගනිමින් ගොගැන් විසින් නිර්මාණය කළ සිතුවම කුමක්ද?.............................................

17. වස්තූන්ගේ පැතලි හා ජ්‍යාමිතික හැඩ සහ තල අවධාරණය වන පරිදි පින්සල් පහරවල් පෙනෙන සේ වර්ණ ගන්වා ඇති ද්‍රව්‍යයන්ගේ ස්වභාවය ඉස්මත්වන පොල් සෙසාන් විසින් අඳින ලද සිතුවම නම්කරන්න?.............................................................................

18. **ශාස්ත්‍රාලිය කලාවේ පැවති සාම්ප්‍රදායික නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනයන් වෙනුවට දෛනික ලෝකේ වස්තු විෂයන් ඇඳි ශිල්පියා කවුද**?............................................

19. වර්ණය ආකෘතිය රටාව සහ රේඛාව යන අංශවල තම අත්හදා බැලීම් හා ගැඹුරු භාව ප්‍රකාශන සහිතව වින්සන්ට් වැංගෝගේ නිර්මාණය වූ තේමාවන් 2ක් නම් කරන්න.

........................................................................................................................................

20.ශිත උණුසුම් සහ අඳුරු වර්ණ එකිනෙනට ගැටෙන සේ අවධාරණය වන පරිදි වර්ණාලේප කළ පශ්වාත් උපස්ථිතිවාදි ශිල්පියෙකු වූ පෝල් සෙසාන්ගේ නිර්මාණ2ක් නම් කරන්න.

.......................................................................................................................................

6.2 යුරෝපයේ චිත්‍ර ශිල්පින්ගේ නිර්මාණ අධ්‍යයනය කිරිම. ( ඝණිකවාදි චිත්‍ර ශිල්පින්)

(06)

1. පැබ්ලෝ පිකාසෝ විසින් භාවිතා කළ ඝණිකවාදි ප්‍රධාන සිද්ධාන්ත 2ක් නම් කරන්න.

(ලකුණු 02)

11. ජෝර්ජ් බ්‍රාක්ගේ නිර්මාණ දෙකක් පිළිබඳ ඇගයිමක් කරන්න.

(ලකුණු 05)

111. ඝණිකවාදි ශෛලියෙන් වුවද ඉතා ප්‍රබල ලෙස සමාජ සංසිද්ධින් **ප්‍රකාශ** කළ හැකිය පිකාසෝගේ සිතුවම් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ඒකක අංකය - 03

පිළිතුරු

1. ක්ලෝඩ් මොනේ / එඩ්ගා ඩෙගා 2. වින්සන්ට් වැන්ගෝ /පෝල් ගොගැන් 3. ක්ලෝඩ් මොනේ

4. ප්‍රකෘති ලෝකයේ විවිධ වස්තූන් මත ආලෝකය පතිතවන ආකාරය හා එමගින් ඇතිවන පර්යාසය අධ්‍යනය කර ප්‍රතිනිර්මාණය කිරීම මෙම කලා ව්‍යාපාරයේ කැපී පෙනෙන ලක්ෂණය විය.

5. 19වන සියවසේ /ප්‍රංශය මුලික කර ගෙන 6. ක්ලෝඩ් මොනේ 7. එඩ්ගා ඩෙගා 8. ක්ලෝඩ් මොනේ

9. මේරි කසාට් ශිල්පිනිය 10. ● මාතෘත්වය ● ධනවත් ප්‍රභූපාන්තික පරිසරයන්හි සැරිසරන ළමුන් හා කාන්තාවන් 11. අර්තාපල් බුදින්නෝ 12. පෝල් ගොගැන් 13. වින්සන්ට් වැන්ගෝ 14. තරු පිරි රැය

15. දෙවියන්ගේ දිනය 16. කහ පැහැති ක්‍රිස්තුන් වහන්සේ 17. ඇපල් වට්ටිය 18. වින්සන්ට් වැන්ගෝ

19. ● කෙත්වතු / ස්ව- ආලේඛ්‍ය 20. ● ඉරිතැළුණු බිත්ති සහිත නිවස /කාඩ් සෙල්ලම් කරන්නෝ

(01) 1. විශ්ලේෂණාත්මක ඝනිකවාදය / සංස්ලේෂණාත්මක ඝනිකවාදය

11. **ජෝර්ජ් බ්‍රාක්** - ප්‍රංශ සිත්තරකු වූ මොහු ඝනිකවාදි කලාවේ දියුණුවට මහත් සේවයක් කළ අයෙකි.

1908-1912 යන කාලය තුළ පිකාසෝ සමග එක්ව නිර්මාණය කටයුතුවල නිරතවිය.මෙහුගේ මුල්කාලින නිර්මාණ තුළින් ෆෝවිසම් කලා ව්‍යාපාරයේ ලක්ෂණ දක්නට ලැබේ.බහුල වශයෙන් නිර්මාණ සඳහා තේමාවන් වූයේ සොබා දහම/නිසල ද්‍රව්‍ය සම්පින්ඩන/ගිටාර් වාදකයන්ය

**<u>නිවාස සහ ගස්</u>** - ●1908 දි අඳින ලද සිතුවමකි.●තෙල් සායමින් කැන්වසය මත ඇඳ ඇත. ● ගස් අතරින් පෙනෙන නිවාස සමුහයක් තේමාව ලෙස භාවිතා කර ඇත.● සරල ජ්‍යාමිතික හැඩ සමුහයකින් ගස් හා නිවාස ගොඩ නගා තිබේ. ● නිවාසවල වහල හා බිත්ති සියල්ල ළා දුඹුරු පැහැ ඝනිකමය හැඩ සමුහයක් ලෙස ඇඳ ඇත. ● සීමිත වර්ණමාලාවකි. ● මෙහි සංරචනය ස්වාභාවිකත්වය බැහැර කරමින් කෝණික හා ආනත හැඩ ඇතුළත් සංරචනයකි. ● ඝනිකවාදි චිත්‍ර කලා ප්‍රයෝග භාවිතා කර ඇත.●විෂයානුබද්ධව නිරූපණය කරන පර්යාවලෝක ලක්ෂණ හා ත්‍රිමාන ලක්ෂණ භාවිතා කර නැත

**<u>ගිටාරයක් සහිත මිනිසා</u>** - ● සිතුවමෙහි තේමා වූයේ ගිටාරයක් වාදනය කරන මිනිසෙකුගේ චලන මාලාවකි. ●හැඩතල සමුහයක සංකිර්ණ සංරචනයක් ලෙස කැන්වසය මත ඇඳ ඇත. ● වර්ණ කිරීමේ දි දුඹුරු - කළු-සුදු භාවිතා කර ඒක වර්ණ ස්වභාවයක් ගෙන ඇත● චිත්‍රයේ කේන්ද්‍රීය අවධාරණය යොමු කර ඇත්තේ ආකෘතිය කෙරෙහිය●වාදකයාගේ හා ගිටාරයේ ප්‍රකෘති හැඩතල ජාමිතික රූපී හැඩ මත ගොඩනගා ඇත

111 ●ඝනිකවාදය 20 වන සියවසේ බිහිවූ කලා ව්‍යාපාරයෙකි ● මෙම ව්‍යාපාරයේ දි වස්තූන් බහුවිධ කෝණයන්ගෙන් නිරීක්ෂණය කොට ඝනිකමය ආකෘතියකට අවධාරණය වන පරිදි කැන්වසය මත ප්‍රතිනිර්මාණය කිරීම මෙම ව්‍යාපාරයේ ප්‍රධානම ලක්ෂණය විය. ● මෙම කලා ව්‍යාපාරයේ ආරම්භකයා ලෙස පැබ්ලෝ පිකාසෝ සලකනු ලබයි ● බොහෝවිට චිත්‍ර ආකාතිමය වශයෙන් සංකීර්ණ ස්වරූපයක් ගනුලබයි

● නමුත් මානුෂීය හැඟීම් දැක්වීමේදි පිකාසෝට එය බාධාවක් නොවූ බව ඔහුගේ ගුවර්නිකා සිතුවම අධ්‍යනය කිරිමෙන් පෙනියයි ● මනුෂ්‍යත්වයේ හැඟීම් මැනවින් නිරූපණය කරන ගුවර්නිකා සිතුවම සඳහා තේමාව වූයේ උතුරු ස්පාඤ්ඤයේ ගුවර්නිකා නගරයට බෝම්බ දැමීමේ අනුවේදනීය සිදුවීමයි.

● සිතුවම සංරචනය කිරිමේදි සංකේතානුරූපිව මළ දරුවකුගේ ශරිරය දරාගෙන වැලපෙන ස්ත්‍රියක්/ගව රූපයක් /වැටුනු සොල්දාදුවෙකු පිළිරුවක්/පහනක් අතින් ගත් රුවක්/දුවන රූපයක් සහ පහළට වැටෙන රුවක් ඇඳ ඇත ● යුද්ධයේ කුරිරූ බව මානුෂියව දැක්විමට ශිල්පියා යෙදූ කළු/සුදු /අළු වර්ණමාලාවද චිත්‍රයේ අර්ථය වැඩි දියුණු කිරිමට සාර්ථකව යොදි ඇත ● ඝනිකවාදි කලා රිතීන්ට අනුව හැඩතල ගලපමින් හැඟීම් ප්‍රකාශනය මැනවින් දක්වා ඇත ● චිත්‍රයේ ඉහළ කොටසේ තාක්ෂණික දියුණුව විසින් ඇති කරන ලද විනාශකාරි බලය අඟවන වියරු ඇසක් තුළ දැල්වෙන බල්බයකි